මධ්‍යම පළාත් සභාවේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව
மத்தியமாகாணசபையின் அரசசேவைகள் ஆணைக்குழு
Public Service Commission of Central Provincial Council

අංක 244, කටුගස්තොටපාර, මහනුවර
இல. 244.கடுகஸ்தொட்டைவீதி.கண்டி
No. 244, Katugasthota Road, Kandy.

web site: www.psc.cp.gov.lk
e-mail: psc.cp.gov@gmail.com

කාර්යාලය / காரியாலயம் / Office — 081-2213097
ලේකම් / செயலாளர் / Secretary — 081-2213096
සහකාරලේකම් / உதவிசெயலாளர் / Asst. Secretary — 081-5631321
ෆැක්ස් / பெக்ஸ் / Fax — 081-2213082

මගේ අංකය / எனது இல. / My No. CPC/PSC/40/06/2016

ඔබේ අංකය / உமது இல / Your No.

දිනය / திகதி / Date 2024-05-03

මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම්,
ආණ්ඩුකාර ලේකම්,
සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා
සියළුම ආයතන ප්‍රධානීන් වෙත,

**මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව පත්වීම් බලධරයා වන සියලු තනතුරු සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාග සහන ලබා දීම සම්බන්ධවයි**

කාර්යක්ෂමතා කඩඉම් විභාග සම්බන්ධයෙන් සහන ලබාදීම සඳහා මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිකුත් කළ චක්‍රලේඛ 02/2016 කෙරෙහි ඔබගේ අවධානය යොමු කරමි.

02. එකි චක්‍රලේඛයේ විධිවිධාන පරිදි කාර්යක්ෂමතා කඩඉම් පරික්ෂණය සම්පූර්ණ කළ යුතු කාල සීමාව තුළ සේවා ව්‍යවස්ථාවෙහි හෝ බඳවා ගැනීමේ පරිපාටියෙහි විධිවිධාන වලට අනුකූලව පැවැත්වීමට නියමිතව තිබූ විභාග අවස්ථා සංඛ්‍යාවට සමාන අනුගාමී විභාග වාර සංඛ්‍යාවක් මඟින් කාර්යක්ෂමතා කඩඉම් පරික්ෂණය සම්පූර්ණ කිරීමෙන් අනතුරුව, මෙම කොමිෂන් සභාව පත්වීම් බලධරයා වන සියලු තනතුරු වලට අයත් නිලධරයන් සඳහා අනුමැතිය ලබා ගැනීමට අනුමත ආකෘතිපත්‍රය අනුව සහන ලබා ගැනීමේ ඉල්ලීම් මෙම කොමිෂන් සභාව වෙත යොමු නොකරන ලෙසත්, අදාළ අනුමැතිය ආයතන ප්‍රධානීන් හට ලබා දිය හැකි බවත් කාරුණිකව දැනුම් දෙමි. ( පවත්වා ඇති කාර්යක්ෂමතා කඩඉම් විභාග සම්බන්ධ තොරතුරු අපගේ වෙබ් අඩවියේ පළකර ඇත.)

03. තවද උක්ත 02 ඡේදයේ විධිවිධාන අදාළ වනුයේ ලිඛිත, වාචික හා ප්‍රායෝගික පරික්ෂණ සඳහා පමණි.හැකියා ප්‍රවර්ධන වැනි පාඨමාලා කාර්යක්ෂමතා කඩඉම් ලෙස සේවා ව්‍යවස්ථා හා බඳවා ගැනීමේ පරිපාටිවල සඳහන්ව ඇති නිලධාරීන්ගේ අදාළ කාර්යක්ෂමතා කඩඉම සම්බන්ධයෙන් වන සහන ඉල්ලීම සඳහා නිර්දේශ ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 1: 14 හි විධිවිධාන පරිදි පහත සඳහන් කරුණු සඳහා පමණක් අනුමැතිය ලබා ගැනීම සඳහා මෙම කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතුය.

I. තමන්ට පාලනය කර ගත නොහැකි හේතූන් මත නියමිත දිනට අදාළ සුදුසුකම් සම්පූර්ණ කළ නොහැකි වීම

II. නියමිත සුදුසුකම් වලට සමාන වෙනත් සුදුසුකමක් ලබා තිබීම

04. කෙසේ වුවද කාර්යක්ෂමතා කඩඉම් සහන සම්බන්ධයෙන් 2023.03.29 දිනැතිව නිකුත් කර ඇති රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 01/2023 හි සඳහන් විධිවිධාන මෙම පළාත් සභා රාජ්‍ය සේවයට අදාළ කර ගැනීමට ආණ්ඩුකාර ලේකම්ගේ අංක GCP/01/1/3 හා 2023.11.20 දිනැති ලිපිය මඟින් ගරු ආණ්ඩුකාරතුමා අනුමැතිය ලබා දී ඇති බව දන්වා ඇති බැවින්, උක්ත විධිවිධාන හා කාර්යක්ෂමතා කඩඉම් විභාග සම්බන්ධයෙන් සහන ලබා දීමට නිකුත් කර ඇති දැනට බලාත්මක මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 02/2016 හා ඊට අනුෂාංගික චක්‍රලේඛයන්හි සඳහන් විධිවිධාන සහ කොමිෂන් සභා තීරණ 2024.06.30 හෝ එදිනට පෙර සමත්වීමට නියමිත දිනය එළඹෙන මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන්ගේ කාර්යක්ෂමතා කඩඉම සඳහා පමණක් වලංගු වන බව ද වැඩිදුරටත් දන්වා සිටිමි.

05. එසේම 2024.07.01 දින හෝ ඊට පසු කාර්යක්ෂමතා කඩඉම සමත්වීමට නියමිත දිනය එළඹෙන මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන්ගේ කාර්යක්ෂමතා කඩඉම් සඳහා සහන ලබා දීම සම්බන්ධයෙන් වූ විධිවිධාන ඉදිරියේ දී නිකුත් කිරීමට නියමිත බවද කාරුණිකව දැනුම් දෙමි.

කුමුදිනී එස්. ප්‍රේමචන්ද්‍ර,
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
මධ්‍යම පළාත.